Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# විරාම ලක්ෂණ

**නැවතීමේ ලකුණ . ( වාක්‍යයක් අවසානයේ දී නැවතීමේ ලකුණ යොදයි.)**

**ක්‍රියාකාරකම 01 - නැවතීමේ ලකුණ වටා රවුමක් අඳින්න.**

ලේනා පේර ගහ දිගේ ආවා. පේර ගස යට වතුර බේසමක් තිබුණා. ලේනා වතුර බේසමට වැටුණා. චේතනා මේ සිද්ධිය දැක්කා. ලේනා බේසමෙන් ගොඩට ගත්තා. චේතනා ලේනා ගේට්ටුව උඩින් තිබ්බා. ගේට්ටුව දිගේ ගිය ලේනා පේර ගසේ තිබූ ලේන් කූඩුවට රිංගුවා. චේතනාට හරි සතුටුයි.

**ක්‍රියාකාරකම 02 - දී ඇති වාක්‍ය කියවා නැවතීමේ ලකුණ යොදන්න.**

එකෝමත් එක කාලෙක දක්ෂ ගොවියෙක් හිටියා මේ ගොවියාට පුත්තු හතර දෙනෙක් හිටියා මේ හතර දෙනා හරිම කම්මැළියි පියා හම්බ කරන දේ කාලා ජීවත් වුණා පියාට උදවු කළෙත් නැහැ ඒ නිසා ගොවිතැන් වැඩත් බැහැ කිසිම දෙයක් ඉගෙන ගත්තෙත් නැහැ පියා ලෙඩ වුණා පුත්තු හතර දෙනාට ජීවත් වෙන්න බැරිව ගියා ගොවියා පුත්තු හතර දෙනාට කතා කළා

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

# ප්‍රශ්නාර්ථ ලකුණ ? (ප්‍රශ්න අසන වාක්‍යවල අගට ප්‍රශ්නාර්ථ ලකුණ යොදයි.)

**ක්‍රියාකාරකම 03 - දී ඇති වාක්‍ය කියවා ප්‍රශ්නාර්ථ ලකුණ යොදන්න.**

- මනුකට තෑගි දෙන්නේ මොනවා ද
- හත්පණ පොතේ මිල කීය ද
- කෝ පුතාගේ උපන් දිනේ ට ලැබුණු කතා පොත්
- අපි ඒ පොතේ කතන්දරයක් කියවමු ද
- නිවාඩු කාලයේ දුන් පාසල් වැඩ මොනවා ද
- ඔබ අද පාසල් එනවා ද
- අපි සෙල්ලම් කරමු ද
- අද දවස කවදා ද
- ඔබ ගමේ යන්නේ කවදා ද
- ඔබේ නම කුමක් ද
- හෙට මම පන්සල් යන්න ද
- ඔයා බත් කෑව ද
- හැමෝම අත් සේදුවා ද
- ඇයි අද පාසල් ආවේ නැත්තේ

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**කොමාව ,** (වාක්‍යයක් අවසන් වීමට පෙර තබන විරාමය සඳහා කොමාව යොදයි.)

හබරල පඳුර ළඟ තිබුණු ටයරය ඇතුළේ වතුර පිරිලා තියෙනවා පබසර දැක්කා. අර බලන්න සමනල ටයරය ඇතුළේ වතුර. ඩෙංගු මදුරුවෝ බෝ වෙයි. සමනල කලබල වුණා. මේ ටයරයට වැලි පුරවලා තියමු. එතකොට වතුර පිරෙන්නේ නැහැ. මතක ද අපට ගුරුතුමී කියා දුන්නා. සමනලත්, පබසරත් ටයරයට වැලි පිරෙවුවා.

**<u>ක්‍රියාකාරකම 04 - දී ඇති වාක්‍ය කියවා කොමාව ලකුණ යොදන්න.</u>**

- අපේ මිදුලේ සුදු රතු කහ සහ නිල් පාට මල් පිපිලා.
- ආච්චි තෙල් මල් සහ හඳුන්කූරු ගෙන පන්සල් ගියා.
- දුවේ තාත්තාට කතා කරන්න.
- අක්කයි අයියයි මමයි මල්ලි සමඟ සෙල්ලම් කළා.
- පුතා හැමෝම එක්ක එන්න කෑම කන්න.
- අම්මයි තාත්තයි නංගියි අත්තම්මයි එක්ක සච්ඡු ඒ ගෙදර සතුටින් හිටියා.
- මනුක රෂිඩ් සංජය නිපුන් මාධවන් සහ ටිරෝන් ආරම්භක ස්ථානයට ගියා.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**ක්‍රියාකාරකම 05 - පහත ඡේද කියවා සුදුසු විරාම ලකුණු යොදන්න.**

| |
|---|
| හත්පණ මඟුල් කෑම හීන්සැරය කතන්දර පොත් ගොඩයි<br>හත්පණ පොතේ මිල කීය ද<br>රුපියල් අසූ පහයි කඩේ මාමා කිව්වා<br>මඟුල් කෑම පොත රුපියල් හැත්තෑවයි අයියා පොතේ මිල බලලා කිව්වා |

| |
|---|
| මනුක මේ මොනව ද ෆාරා ඇසුවා<br>මේ නිවිති අර ගොටුකොළ ඊට එහා පැත්තේ<br>කංකුං අර තියෙන්නේ සාරණ ඊට මෙහා පැත්තේ<br>මුකුණුවැන්න පෝච්චිවල තියෙන්නේ වම්බටු<br>බණ්ඩක්කා වගේ එළවළු මනුක කියාගෙන<br>කියාගෙන ගියා<br>රම්පෙ කරපිංචා අමු මිරිස් අපි කඩෙන්<br>ගෙනෙන්නේ නැහැ තාත්තා කිව්වා<br>මටත් ආසයි අපේ වත්තේ වගා කරන්න ෆාරා<br>කිව්වා |